# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව 2009-04-30

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2009.04.30

වේලාව : පෙ.ව.10.45

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | | |
|---|---|---|
| 01. | ගරු සභාපති | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 02. | ගරු උපසභාපති, | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 03. | ගරු නගර සභා මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 04. | ගරු නගර සභා මන්ත්‍රී | ජී.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. | ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 06. | ගරු නගර සභා මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07. | ගරු නගර සභා මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 08. | ගරු නගර සභා මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |
| 09. | ගරු නගර සභා මන්ත්‍රී | ඩබ්. විමලසේන මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

01. නාගරික ලේකම් - ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

අද දින පැවැත්වෙන සභා රැස්වීමට සඳහා සහභාගීවීමට පැමිණ සිටින, ගරු උපසභාපතිතුමා, නාගරික මන්ත්‍රීතුමන්ලා, හා ලේකම්තුමා සාදරයෙන් පිළිගත් ගරු සභාපතිතුමා, ලැබුවා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සැමට සාමය සතුට පිරි සෞභාග්‍යමත් සුභ අලුත් අවුරුද්දක් වේවා යි ප්‍රාර්ථනය කරන බව දැන්වීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, අතිගරු ජනාධිපතිතුමා මේ රටේ ඒකීයභාවය ඇතිකිරීම සඳහා විශාල මෙහෙවරක් ඉටුකරන බවත්, එතුමාගේ නායකත්වය මත යුද්ධය අවසන් කිරීමට ත්‍රිවිධ හමුදාව කටයුතු කරන අතර මේ විට උතුරේ සාමාන්‍ය වැසියන් බේරාගෙන යුද්ධය අවසන් කිරීමේ තීරණාත්මක සටනක යෙදී සිටින බවත් දැන්වීය.

උතුරේ අවතැන්ව සිටින ජනතාවට ආහාර,ඇඳුම් පැළඳුම් ,ප්‍රථමාධාර ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබෙන අතර, රජයේ සියළුම දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ප්‍රධානීන් දැනුවත් කොට ඔවුන්ට අවශ්‍ය ආධාර ලබාදීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බවත්, සබරගමුව පළාත් සභාවද ආධාර ලබාදීමේ කාර්යය මේ වන විට ආරම්භ කර ඇති අතර, ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාගේ ඉල්ලීමකට අනුව මෙම නගර සභාව ද වියළි ආහාර,නිම් ඇඳුම් ,භාණ්ඩ ලබාදීමට පියවර ගත් බවත් පැවසීය. බළන්ගොඩ නගරයේ හෙළබොදු ව්‍යාපාරික පදනම හා වෙළඳ සංගමය,කැඳවා සාකච්ඡා කර නගරයේ ව්‍යාපාරිකයින් හා නාගරික වැසියන් දැනුවත් කොට ඒ සඳහා අනුග්‍රහය ලබාගත් අතර , ඒ සම්බන්ධව සියළු දෙනාටම සභාවේ ස්තුතිය පළකරන අතර, ඉදිරියේ දී විධිමත් පරිදි සභාවේ ගෞරවය හා ප්‍රණාමය එම සියළු දෙනා වෙතම දන්වා යැවීමට පියවර ගන්නා බවත් පැවසීය.

මෙම වර්ෂය සඳහා ගම නැගුම වැඩ සටහන යටතේ ( ජන සභා මගින් තෝරාගන්නා ලද යෝජනාවන් සඳහා ) මුදල් ප්‍රතිපාදන ඉල්ලා සිටිය ද ග්‍රාම සේවා වසම් 04 පමණක් මුදල් වෙන්ව ඇති බවත්, එම නිසා බළන්ගොඩ නගර බලප්‍රදේශයේ සියළුම ග්‍රාම සේවා වසම් ආවරණය වන පරිදි මුදල් වෙන්කරදෙන ලෙස තමා ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලා යැවූ බවද දන්වමින් සභාවේ ඉතිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03). **<u>2009.03.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම</u>ඃ**

2009.03.26 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්. රූම් මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **<u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම</u>ඃ**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **<u>සභාවට ඉදිරිපත් කර ඇත ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම</u>ඃ**

05ඃ01 **<u>බළන්ගොඩ තානායම සඳහා භාණ්ඩ මිළදී ගැනීම</u>ඃ**

බළන්ගොඩ තානායම සඳහා පහත සඳහන් භාණ්ඩ ප්‍රමාණය මිළදී ගැනීම සුදුසු බැව් දන්වමින් වැඩ අධිකාරි මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

| | |
|---|---|
| 01. සෙරමික් පිඟන් | 500 |
| 02. කරි දිසී කුඩා | 50 |
| 03. කරි දීසි විශාල | 50 |
| 04. බත්දීසි ලොකු | 25 |
| 05. සුප් කෝප්ප | 50 |
| 06. සුප් බෝල් | 25 |
| 07. අතුරු පස කප් ( තට්ටුව සහිතව ) | 500 |
| 08. වතුර බොන වීදුරු | 500 |
| 09. පීරිසි කෝප්ප | 100 |
| 10. සුදු යකඩ ටී සෙට් | 10 |
| 11. තේ හැඳි | 300 |
| 12. බත් බෙදන හැඳි | 25 |
| 13. මේස හැඳි | 50 |
| 14. හැඳි ගෑරුප්පු කට්ටල | 300 |
| 15. අත සෝදන කෝප්ප | 25 |
| 16. අළු බඳුන් | 20 |
| 17. විස්කි බඳුන් | 100 |
| 18. බියර් බඳුන් | 100 |
| 19. රතු වයින් බඳුන් | 25 |
| 20. සුදු වයින් බඳුන් | 25 |
| 21. සයිඩ් ප්ලේට් | 100 |
| 22. සෙරමික් ජල ජෝග්ගු | 20 |
| 23. ඇන්කර් රැඳවුම් | 25 |
| 24. ලුණු , ගම්මිරිස් රැදවුම් | 25 |

මෙම භාණ්ඩ ප්‍රමාණය මිල ගණන් කැඳවා මිළදී ගැනීමට සභාව අනුමත කරන ලදී.

බළන්ගොඩ තානායම උපරිම වියදමක් කර වර්තමානයට ගැලපෙන ආකාරයට නවීකරණය කිරීම සුදුසු බව ගරු උපසභාපතිතුමා විසින් පවසන ලදී. මේ සම්බන්ධව මීට පෙර සාකච්ඡා කිහිපයක් පැවැත් වූ බවත්, එම රැස්වීම් වලට ගරු උපසභාපතිතුමා සහභාගී නොවූ බවත්, තානායම අලුත්වැඩියා කිරීමේ කටයුතු දැනට ආරම්භ කර ඇති නිසා, එය වෙනස් කිරීම ප්‍රායෝගික නොවන බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් පැවසීය. තමා මෙම ක්ෂේත්‍රයේ සිටින අයෙකු වන නිසා මේ සම්බන්ධව තමාට අවබෝධයක් තිබෙන බවත්, අද කාලයට ගැලපෙන ආකාරයට මෙය නවීකරණය කරගතහොත්, වැඩි ආදායමක් ලබාගත හැකි බවත්, මේ සඳහා සකස් කර ඇති ඇස්තමේන්තුව තමන් වෙත ලබාදෙන ලෙසත්,ඊට 25% ක අඩුවෙන් මෙය ඉටුකරදීමට හැකිබවත් පැවසීය.

ගරු උපසභාපතිතුමා ප්‍රකාශ කල අදහස කාලෝචිත බවත්, නමුත් මෙහි පෞරාණිකත්වය රැකගෙන නවීකරණය කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් පවසන ලදී.

05:02 **ජාතික පුස්තකාල සතිය වෙනුවෙන් පොත් පරිත්‍යාග කිරිම:**

ඉහත සඳහන් කරුණට අදාළව , ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) විසින් එවා ඇති 2009.02.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බළන්ගොඩ මහජන පුස්තකාලයට රු.5000/- ක් වටිනා පොත් කට්ටලයක් පරිත්‍යාග කිරීමට සූදානම් කර ඇති බවත්, එම පොත් කට්ටලය 2009.05.13 දින පෙ.ව.9.00 සිට ප.ව.2.30 අතර කාලය තුළ ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලයට පැමිණ ලබාගන්නා ලෙසත්, මෙදින දිවයිනේ ප්‍රමුඛ පෙළේ පොත් ප්‍රකාශකයන් රාශියක් සහභාගීවන පොත් ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා කටයුතු

සංවිධානය කර ඇති බවත්, එහි දී විශේෂ සහන වට්ටම් යටතේ මහජන පුස්තකාලය සඳහා පොත් මිළදි ගැනීමේ අවස්ථාව ද සලසා ඇති බව එමගින් අවධාරණය කර තිබිණ.

මේ පිළිබඳව සලකා බැලූ සභාව අවශ්‍ය පොත් ලැයිස්තුව සකසා මිළදි ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **කසල බද්දෙන් නිදහස් කිරීම** :

ඉහත කරුණට අදාළව බළන්ගොඩ,අංක 19/1 කල්තොට පාර යන ලිපිනයේ පදිංචි විග්නේෂ්වරන් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

උක්ත ස්ථානය 2009.01.01 දින සිට වසා ඇති බැවින්, කසල බද්ද අයකල යුතු නොවන අතර, පසුගිය වර්ෂය සඳහා එම බද්ද සම්පූර්ණයෙන් ගෙවා ඇති බැවින්, බලපත්‍ර ලේඛණයෙන් නම ඉවත් කිරිම සුදුසු බව මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් වාර්තා කර ඇති බව ලේකම් මහතා සභාවට දන්වන ලදී.

මෙම දේපල සඳහා කසල බද්ද අයනොකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:04 **වෙසක් පුන් පොහොය නිමිති කරගෙන මහා බත් දන්සක් පැවැත්වීමට අවසර ඉල්ලීම.**

බළන්ගොඩ , බුලත්ගම,රුවන් ක්‍රීඩා සමාජය විසින් වාර්ෂික පවත්වනු ලබන මහා බත් දන්සල 2009.05.08 වන දින පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇති බැවින්, ඒ සඳහා බළන්ගොඩ නගරයෙන් මුදල් හා ද්‍රව්‍යමය ආධාර එකතු කිරීමට අවසර ලබාදෙන ලෙසත්, බළන්ගොඩ නගර සභා කාර්යාලයේ ජල බවුසරය හා යකඩ මඩුව ලබාගැනීමටත්, අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් එම ක්‍රීඩා සමාජයේ සභාපති විසින් එවා ඇති ලිපිය සභාගත කරන ලදී.

නගරයේ ජනතාවගෙන් මුදල් එකතු කිරීමට අවසර ලබාදිය නොහැකි බවත්, පුන්‍යමය කටයුත්තක් බැවින් සභාව සතු ජල බවුසරය නොමිලයේ ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:05 **රථ වාහන නවතා තැබීමේ ගාස්තු ගෙවීම:**

උක්ත කරුණට අදාළව බළන්ගොඩ නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමේ ටෙන්ඩරය ලබාගෙන සිටින ඩී.පී.වීරපුර යන අය විසින් එවා ඇති 2009.03.30 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

රථ වාහන නැවතීමේ ගාස්තු අප්‍රේල් මස 13 වන දින සිට 23 වන දින දක්වා අවුරුදු නිවාඩු සේ සලකා එම කාල සීමාවට අදාළ මුදල මෙම ටෙන්ඩරයෙන් අඩුකිරීමට අවසර ලබාදෙන ලෙස එමගින් ඉල්ලා ඇති බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

මේ සඳහා අනුමැතිය ලබාදිය නොහැකි බව සභාව තීරණය කරන ලදී.

05:06 **උතුරු පළාතේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය කිරීම**

ඉහත සඳහන් කරුණට අදාළව, පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති අංකඃ සීඑල්ජී/4619 හා 2009.04.27 වන දිනැති ලිපිය සභාගත කරන ලදී.

ගරු සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගේ මුළිකත්වයෙන් සබරගමුව පළාත් සභා රැස්වීම් ශාලාවේ දී පැවති සාකච්ජාවක දී ගරු සභාපතිවරුන් විසින් පළාත් පාලන ආයතන වලින් කලයුතු දායකත්ව පිළිබඳව අදහස් ඉදිරිපත් කල බවත්, සභා අරමුදලින් රු.50,000/- ක් ලබාදීමටත්, එම මුදලින් වියළි ආහාර උතුරේ අවතැන් වූ ජනතාවට ලබාදීම සුදුසු යැයි යෝජනා වූ බැවින්, සභා අරමුදලින් රු.50,000/- ක් 2009.05.05 දිනට පෙර කෑගල්ල හා රත්නපුර පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් වෙත මුදලින් භාරදීමට කටයුතු කරන ලෙස හෝ රු.50,000/- ක් වටිනා හාල්,කිරි පිටි හා පරිප්පු ප්‍රදේශයේ සමුපකාර ආයතනයකින් මිළදී ගෙන පළාත් සභාවට භාරදීමට කටයුතු කරන ලෙසත්, සභා අරමුදලින් දරනු ලබන දායකත්ව මුදල සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගත යුතු බැවින්, ඒ සඳහා සභා තීරණයක් ගෙන ඉදිරිපත් කරන ලෙසත් වැඩිදුරටත් එමගින් දන්වා තිබිණ.

සභා අරමුදලින් රු.50,000/- ක මුදලක් ලබාදීමට සභා අනුමැතිය ලබාදෙන ලදී.

05:07 **Slauge pump (සලජ් පම්ප් )එකක් ලබාගැනිම**

Night Soil Treatment Plan එක සඳහා tys Sedimentation jk Sludge Dry Bed tlg Pump කිරීම සඳහා අගල් 2 1/2 Single Phase Sludge Pump එකක් ලබාදෙන ලෙස ඉල්ලමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මිළගණන් කැඳවා ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **ජේ.සී.බී.යන්ත්‍ර ක්‍රියාකරුට දිමනාව ගෙවීම**

මෙම නගර සභාවේ ජේ.සී.බී.යන්ත්‍ර ක්‍රියාකරු වන මංජුල ප්‍රසන්න මහතා තම දෛනික දීමනාව දිනකට රු.600/- බැගින් ලබාදෙන ඉල්ලා ඇති බැවින්, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින් විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, දිනපතා සේවයට වාර්තා කරන ලෙස දැණුම් දීමටත්, දිනකට රු.600/- ක් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට ලබාගැනීමටත් සභාව තීරණය කරන ලදී.

05:09 ජාතිත ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බළන්ගොඩ ජල සම්පාදන ක්‍රමයේ තුඹුමං ළිඳ ක්ලෝරීනේටර් ගොඩනැගිල්ල හා ස්ථාන භාරකරු නිල නිවස ඉදිකරඇති ඉඩම පවරා ගැනීම

උක්ත කරුණට අදාළව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ( ගැටඹේ පේරාදෙණිය ) ඉඩම් අත්කරගැනීමේ නිලධාරී විසින් එවා ඇති 2009.04.10 ලිපිය සභාගත කරන ලදී. තුඹුමං ළිඳ ක්ලෝරීන් කාමරය හා ස්ථානභාරකරු නිල නිවස ඉදිකර ඇති රජයේ ඉඩම් කොටස දිර්ඝ කාලීන බදු පදනම මත මණ්ඩලය වෙත පවරා ගත යුතුව ඇති බැවින්, දිර්ඝ කාලීන බදුලබාදීම සඳහා බළන්ගොඩ නගර සභාවේ එකත්වය ලබාදෙන ලෙස බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් ඔහුගේ අංක.ඩීඑස්බී/එල්/5/7/2/37 දරණ ලිපියෙන් මෙම නගර සභාව වෙත දන්වා ඇති බවත්, එබැවින්, ඒ සඳහා නගර සභාවේ එකගත්වය කඩිනමින් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යැවීමට කටයුතු කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ එකගත්වය ලබාදීමට තීරණය කරන ලදී.

05:10 බළන්ගොඩ නව නගරයේ බැංකු සඳහා වෙන්කර ඇති ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම

ඉහත ව්‍යාපෘතියේ කටයුතු සතුටුදායක ලෙස අවසන් කර ඇති බැවින්, නාගරික සංවර්ධන අධිකාරියේ මුදල් ලබාදෙන තෙක් කොන්ත්‍රාත්කරු හට අදාල මුදල් ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලමින්, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමණාකරන) රේණුකා වික්‍රමසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

දැනට තානායම ඉදිකිරීම හා එයට අදාල භාණ්ඩ මිළදි ගැනීමට ඇති බැවින් මෙම මුදල් ගෙවනු ලැබුවහොත්, මුල්‍ය අර්බුදයකට සභාව මුහුණදීමට සිදුවනු ඇති බව ලේකම් මහතා විසින් පැහැදිලි කරන ලද අතර ලංකා බැංකු ගිණුමෙන් එම මුදල් නැවත මුදල් ගෙවා ඇති මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට සභාව අනුමත කරන ලදී.

05:11 **බළන්ගොඩ බල ප්‍රදේශයේ අයාලේ යන ගවයින් ලබාගැනීම.**

උක්ත කරුණට අදාළව ඩෙන්ඩ්‍රො ලංකා ප්‍රජා සත්කාර පදනමේ සභාපති විසින් එවා ඇති 2009.03.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

"මහින්ද චින්තන" ප්‍රතිපත්තියට අනුව මන්ද පෝෂණයෙන් පෙළෙන පෙර පාසල් දරුවන් සඳහා නැවුම් එළකිරි වීදුරුවක් ලබාදීමේ ව්‍යාපෘතියක් දැනටමත් ඉහත පදනම මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත්, අයාලේ යන ගවයින් ඒකරාශී කොට මෙම ප්‍රජා සත්කාර්ය සාර්ථක කරගැනීමට අදහස් කරන බවත්, එබැවින් මෙම ප්‍රදේශයේ අයාලේ යන ගවයින් මෙම ව්‍යාපෘතියට යොදා ගැනිමට වැඩ පිළිවෙලක් සකස් කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ එකගත්වය ලබානොදෙන ලදී.

05:12 ඕළුගන්තොට සුසාන භූමියේ තීන්ත ආලේප කිරීම

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පිහිටි ඕළුගන්තොට සුසානාගාර භූමිය ක්‍රමවත්ව පවත්වාගෙන යෑමට ගරු සභාව ගත් තීරණයට නගර සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට ස්තුතිය පළකර සිටින අතර, සුසානාගාරයේ තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය තීන්ත ප්‍රමාණය ලබාදීමට කටයුතු කරදෙන මෙන් ඉල්ලමින් ඕළුගන්තොට එකමුතු සුභ සාධක සමිතියේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

එම සුසාන භූමිය නගර සභාව සතු වුවක් බැවින් ඇස්තමේන්තුවක් සකස් කර ඒ අනුව, තීන්ත ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙනී ලදී.

05:13 මගී ආවරණ සකස් කරගැනීම

උක්ත කරුණට අදාළව ඕළුගන්තොට එකමුතු සුභ සාධක සමිතියේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ මූළික රෝහල අසලට මගී ආවරණ කුටියක් හා දිය පිපාසය නිවා ගැනීමට ජල කරාමයක් ද, පොදු වැසිකිලියක් ද එම ස්ථානය සකස් කරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

නගර සභාව විසින් බළන්ගොඩ මූළික රෝහල ඉදිරිපිට මැලිබන් ආයතනයේ අනුග්‍රහයෙන් හා පොලීසියේ අනුග්‍රහයෙන් ඉදිකරන ලද බස්නැවතුම්පල මාර්ග සංවර්ධනය සඳහා කඩ ඉවත් කර ඇති බැවින්, නැවත එය සකස් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කිරීමට සභාව තීරණය කරන ලදී.

05:14 බළන්ගොඩ සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ ආරම්භ කර ඇති කෝප්සිටි වෙළඳසල ආවරණය වන පරිදි වාහන නවතා ටයර් අළුත්වැඩියා කිරීම.

සී/ස බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ ආරම්භ කර ඇති කෝප්ස්ටි වෙළඳසැල ආවරණය වන පරිදි දිනපතා වාහන නතර කර ඒවායේ ටයර්/ටියුබ් අළුත්වැඩියා කටයුතු සිදුකරනු ලබන බවත්, මේ නිසා වෙළඳසැලේ වෙළඳාම් කටයුතු අඩපන වන අතර, පාරිභෝගිකයන්ගේ පැමිණීම ද දුර්වල බවත්, එබැවින්, ප්‍රධාන කාර්යාලය ඉදිරිපස කොටස වෙන් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින් සීමාසහිත බළන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව,

මෙම අවහිරතාව ඉවත්කරදෙන ලෙස පොලීසියට හා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී.

05:15 වරිපනම් බද්දෙන් නිදහස් කිරීම

බළන්ගොඩ රත්නපුර පාරේ අංක:40 1/1 දරණ දේපල 2003 වසරේ සිට වසා ඇති බැවින්, වරිපනම් බදු මුදලින් නිදහස් කරන ලෙස ඉල්ලමින්, බළන්ගොඩ,වීරසුන්දරාරාම පාර අංක:11 දරණ ලිපිනයේ පදිංචි බී.සුනිල් කැමිලස් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම දේපල වර්ෂ දෙක තුනක පමණ කලක් වසා ඇති බැවින්, වරිපනම් බදු අඩක් නිදහස් කිරීම සුදුසු බව ආදායම් අංශයෙන් වාර්තා කර ඇතිබව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදුව, වරිපනම් බදු අඩක් පමණක් අයකිරීමට තීරණය කරන ලදී.

05:16 මාර්ග නඩත්තු කටයුතු සඳහා තාර මිළදී ගැනීම.

මෙම නගර සභාවේ මාර්ග නඩත්තු කටයුතු සඳහා ලීටර් 200 තාර බැරල් 30 ක් මිළදී ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලමින්, කාර්මික නිලධාරී මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදුන් අතර, ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලබාගැනීමට තීරණය කරන ලදී.

05:17 ආදේශක පුස්තකාල සහයක තනතුර

කාලයක් ආදේශක පුස්තකාල සහයිකාවක් ලෙස සේවය කරන ලද බළන්ගොඩ,කොටුගොඩැල්ල යන ලිපිනයේ පදිංචි නෙල්කා නිරෝෂණී යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

වසර 14 ක පමණ කාලයක් තිස්සේ මෙම නගරසභාව වෙනුවෙන් සේවය කරන ඉන්දුකා ප්‍රියානි යන අය මෙම තනතුර සඳහා බඳවා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාම ඒකමතිකව ප්‍රකාශ කල වුවද, ස්ථිර තීරණයකට සභාව නොඑළඹෙන ලදී.

05:18 **සන අපද්‍රව්‍ය කළමණාකරන පුහුණු වැඩ මුළුව**

බළන්ගොඩ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්.ඒ.නිමල් ප්‍රේමතිලක මහතා 2009.05.10 වන දින දක්වා ජපානයේ ජයිකා ආයතනයේ පවත්වනු ලබන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු වැඩමුළුවට සහභාගී වීමට නියමිත බැවින්,ඔහුගේ යැපීම් දීමනා හා අනෙකුත් දීමනා සහා අරමුදලින් දැරීමට සභාවේ අනුමැතිය පතමින් විෂය භාර නිලධාරි විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව , මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06. මුදල් ගෙවීම් අනුමත කිරීම
**(රු. 10000/- ට වැඩි මුදල් ගෙවීම් )**

සභාවට ඉදිරිපත් කර ඇති රු.10000/- ට වැඩි මුදල් ගෙවීම් විස්තරයේ අඩුපාඩු රැසක් පවතින බව ගරු මන්ත්‍රීතුමන්ලා විසින් පෙන්වා දෙනු ලැබූ අතර, එම අඩුපාඩු නිවැරදි කර විශේෂ මහ සභා රැස්වීමට ඉදිරිපත් කරන ලෙස විෂය භාර නිලධාරිණිය වෙත දැණුම් දීමට සභාව තීරණය කරන ලදී. විෂය භාර නිලධාරිණිය අද දිනයේ නිවාඩු ලබාගැනීම නිසා මෙම මුදල් ගෙවීම් වල පවතින අඩුපාඩු සම්බන්ධව කරුණු විමසීමට නොහැකිවී තිබෙන බවත්, මහ සභා රැස්වීම පවත්වන දිනයේ දී නිවාඩු ලබාගැනිමෙන් වලකින ලෙස තමා නිලධාරින් හා සේවකයින් වෙත උපදෙස් ලබාදි තිබෙන බවත්, නමුත් එම උපදෙස් සැලකිල්ලට නොගෙන කටයුතු කර තිබෙන බවත්, එබැවින්, මේ සම්බන්ධව එම නිලධාරිණියගෙන් නිදහසට කරුණු විමසීමට තීරණය කරන ලදී.

07. **ඇස්තමේන්තු අනුමත කිරීම**

07:01 සුදර්ශනපුර පාර රාජපක්ෂ මහතාගේ නිවස අසල හියුම් පයිප්ප
බෝක්කු දමා කාණු ඉදිකිරීම කර්මාන්තය රු. 92297.07

07:02 පල්ලෙකුඹුර මාර්ගය පැති බැම්ම ඉදිකිරීම රු.207760.24
07:03 බුලත්ගම තලාව පාර දකුණු පස මාර්ගය ඉදිකිරීම රු. 28426.12
ඉහත ඇස්තමේන්තු සභාව විසින් අනුමත කරන ලදි.

08.1 **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

11. **යථා පරිදි කල් දී ඇති යෝජනාඃ**

09. **ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීමඃ**

09:01 මෙම නගර සභාව සඳහා අවශ්‍ය පරිගණක පද්ධති මිළදි ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිළ ගණන් පහත දක්වා ඇත.

| | JAAN Computer Services | PC House (pvt) Ltd | Nunet Computers (PVT) Ltd | Ceilon Business Appliances | E-wis |
|---|---|---|---|---|---|
| පරිගණක පද්ධති 01 | 42200/- | 47500/- | 54000/- | 79500/- | 68700/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති JAAN Computer Services ආයතනයෙන් අවශ්‍ය පරිගණක පද්ධති මිළදි ගැනීමට සභාව අනුමත කරන ලදී.

90:02 සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය භාණ්ඩ මිළදි ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| භාණ්ඩය | ඇලගෙසන් ට්‍රේඩර්ස් (කොළඹ ) | නිව් ජෝති ස්ටෝර්ස් (බළන්ගොඩ) | සේන ස්ටෝර්ස් (බළන්ගොඩ ) |
|---|---|---|---|
| ටී.සී.එල්.පවුඩර් 100 කි.ග්‍රෑ. | 8860.00 | 950.00 | 970.00 |
| පීනෝල් 20 ලීටර් | 1803.00 | 1900.00 | 1925.00 |
| ජර්මෙක්ස් 10 ලීටර් | 1081.50 | 1200.00 | 1210.00 |
| එයා(ර්) ප්‍රෙෂ්නර් 02 ලීටර් | 670.00 | 850.00 | 850.00 |
| හාෆික් පවුසර් 05 කි.ග්‍රෑ | - | - | - |
| එච්.සී.එල්. 08 ලීටර් | 620.00 | 675.00 | 700.00 |
| Ross 08 ලීටර් | 1340.00 | 1425.00 | 1400.00 |
| Toil Wash 12 ලීටර් | 1391.00 | 1450.00 | 1430.00 |
| පැඟිරි තෙල් 100 | 51500.00 | 57500.00 | 58000.00 |
| රබර් ග්ලවුස් හෙට් 100 | 8240.00 | 8650.00 | 8700.00 |
| රබර් ග්ලවුස් ලොකු 100 | 10300.00 | 10500.00 | 105.00 |
| Mask 20 | 1854.00 | 1920.00 | 1930.00 |

අවම මිළ ඉදිරිපත් කර ඇති ඇලගේෂන් ට්‍රේඩර්ස් ආයතනය වෙතින් අදාල භාණ්ඩ මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:03 නව බස්නැවතුම්පල ඉදිරිපිට බැම්ම බැඳ දැල ගැසීමේ කර්මාන්තය හා බැංකියවත්ත මළප්‍රවාහන පද්ධතියේ ගේට්ටුව ඉදිකිරීම කර්මාන්තය සඳහා කැඳවන ලද මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| භාණ්ඩය | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් ඇන්ඩ් අයන් වර්ක්ස් | යශෝධා හාඩ්වෙයාර් | දේශානී හාඩ්වෙයාර් |
|---|---|---|---|
| 2"x2" චේන්ලින්ක් දැල් රෝල් 01 | 28047.00 | 28500.00 | 28250.00 |
| GI වයර් 1 කි.ග්‍රෑ | 477.00 | 480.00 | 477.00 |
| 6. අමානෝ සීට් 01 | 1260.00 | 1275.00 | 1290.00 |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ගණන ඉදිරිපත් කර ඇති ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් ආයතනයේ මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

10. **යෝජනා**

**ගරු නගර සභා මන්ත්‍රී,ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

බළන්ගොඩ නගර සභා සීමාව තුළ පවත්වාගෙන යන පෞද්ගලික උපකාර පංති වල ඉගැන්වීම් කටයුතු කරනු ලබන ඇතැම් ගුරුවරුන්ගේ අකටයුතුකම් නිසා දුවා දරුවන්ට යම් යම් ප්‍රශ්ණ මතු වී ඇති බව දැනගැනීමට ලැබී ඇති බවත්, ඒ පිළිබඳව යම්කිසි විනය ක්‍රියාමාර්ගයක් ගත යුතු බව පැවසීය. මෙම පංති වල ඉගැන්වීම් වල නිරත වන ඇතැම් ගුරුවරුන්ට ඒ සඳහා තිබෙන්නේ ප්‍රායෝගික පුහුණුව වන අතර, ඇතැම් ගුරුවරුන්ට ඒ සඳහා වෘත්තීමය සුදුසුකම් නොමැති බවත්, මෙවැනි හේතූන් නිසා විවිධ ගැටළු නිර්මාණය වී තිබෙන බවත් ගරු මන්ත්‍රීවරුන් විසින් සාකච්ඡා කරන ලදී. බෞද්ධ ශිෂ්ටාචාරය වැනි විෂයයන් මුදලට ඉගැන්වීමට භික්ෂූන්වහන්සේලා කටයුතු කරන බවත්, බෞද්ධයින් වශයෙන් මේ සම්බන්ධව අප කණාටුවිය යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් පැවසීය.

මෙම යෝජනාව සම්බන්ධව සබරගමුව පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත කරුණු ඉදිරිපත්කිරිමට සභාව තීරණය කරන ලදී.

11. **කාරක සභා වල වාර්තා සලකා බැලීම**:

11:02 2009.03.01 සිට 2009.03.25 දක්වා මෙම සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

12. **ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරීම**:

2009 වර්ෂයේ මාර්තු මාසයට අදාළ ආදායම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 3805917.44 |
| වෙනත් ලැබීම් | 1766015.57 |
| | ------------- |
| මුළු ලැබීම් | 5571933.01 |
| | |
| පුනරාවර්ථන වියදම | 4315803.85 |
| වෙනත් වියදම් | 4680188.07 |
| | ----------- |
| මුළු ගෙවීම් | 8995991.92 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු** :

13:01 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.විමලසේන මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, බලන්ගොඩ,බලගහමුල මංසන්ධියේ නිරන්තරව වහන අනතුරු සිදුවන බවත්, එම නිසා එම ස්ථානයට සංඥා විදුලි බුබුලු ( කලර් ලයිට් ) සවිකිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින අතර, සභා වාර්තාව සතියකට කලින්වත් ගරු මන්ත්‍රීවරුන් අතට පත්කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ ඇල්ලෙපොල වැවේවත්ත මාර්ගයට ගෙපලකින් කපන ලද පස් ගෙනවිත් දමන බවත්, එබැවින් ඒ පිළිබඳව පරීක්ෂා කර එය වැලැක්වීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා**:

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, 2009 වර්ෂයේ බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට ගම නැගුම වැඩ සටහන යටතේ මුදල් ප්‍රතිපාදන වෙන්ව ඇත්තේ වසම් 04 කට පමණක් බවත්, බළන්ගොඩ කුමාරගම,බුලත්ගම,තලංගම ,දෙහිගස්තලාව යන ප්‍රදේශ සඳහා ඉදිරිපත් කල යෝජනා සඳහා බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට මුදල් වෙන්ව ඇති බවත් එබැවින්, මේ සම්බන්ධව ගරුසභාපතුමාගේ අවධානය යොමු කර එම මුදල් මෙම සභාව වෙත වෙන්කරගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

13:03 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, බළන්ගොඩ මූලික රෝහලට රජය මගින් ලබා දී ඇති ලේ පරීක්ෂා කිරීමේ යන්ත්‍රය මේ වන විට අක්‍රිය වී ඇති බැවින්, අහිංසක රෝගී ජනතාවට පෞද්ගලික ආයතන වලින් රු.500/-,600/- ගෙවා අදාල වාර්තාවන් ලබාගැනීමට සිදුව ඇති බව දැන්විය.

මේ සම්බන්ධව විශේෂ අවධානය අදාල බලධාරීන් වෙත යොමුකරවීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා, ඇතැම් උපකාරක පංති වලින් දුවා දරුවනට අකටයුතුකම් සිදුවන බව තමා ද පිළිගන්නා බවත් පවසමින් සිය කථාව අවසන් කරන ලදී.

13:04 **ගරු නාගරික මන්ත්‍රී,ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, මෙම නගර සභාවේ මූලිකත්වයෙන් බළන්ගොඩ පොලීසිය,ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය(බළන්ගොඩ ඩිපෝව ) ඒකාබද්ධව සාකච්ඡා කර බළන්ගොඩ නගරය තුළ විධිමත් පරිදි රථවාහන ධාවන සැලසුම් සකස් කල බවත්, නමුත් ඇතැම් රියදුරන් කහ ඉරි මත වාහන නැවැත්වීම,බස්නැවතුම් ස්ථාන වල හැර අනෙකුත් ස්ථාන වලින් මඟීන් පැටවීම හා බැස්සවීම සිදුකරන බවත්, රත්නපුර සිට පැමිණෙන බස් රථ ඔරලෝසු කණුව අසලින් නව ප්‍රවේශ මාර්ගයට ඇතුළු කිරීම සිදුකරන බැවින්, එම බස් රථ බාන්ස් රත්වත්ත මාවත හරහා ධාවනය කරවීමට කටයුතු කල යුතු බවත්, බස්රථ ප්‍රධාන වීදියෙන් බස්නැවතුම්පලට ඇතුළු කර පිටවීම නව ප්‍රවේශ මාර්ගයෙන් සිදුකිරීමට කටයුතු සැලසිය යුතු බවත්, දන්වන ලද

අතර, මේ සම්බන්ධබව අදාල බලධාරීන්ගේ අවධානය යොමුකරවීමට කටයුතු සලසා දෙන ලෙස ද ඉල්ලීමක් කරන ලදී.

මෙම සභාවේ විපක්ෂනායක ගරු යූ.එච්.ගාමිණී මැතිතුමාගේ දයාබර මෑණියන් පසුගිය දා අභාවප්‍රාප්ත වු බවත්, එම අභාවය සම්බන්ධව මෙම සභාවේ ශෝකය ගරු මන්ත්‍රිතුමා ඇතුළු පවුලේ ඥාතීන් වෙත පළකිරීමට යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී,ඩබ්.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ස්ථිරන කරන ලදි.

මෙම නගර සභා බලප්‍රදේශයේ ග්‍රාමීය මංමාවත් කැලෑ වැවී කාණු ගොඩ වි ඇති බැවින්, එම මාර්ග පිළිසකර කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.නගරයේ විථි පහන් ක්‍රමවත්කරන ලෙස තමා මීට පෙර පැවති රැස්වීම් කිහිපයකදීම නිරන්තරව ඉල්ලා සිටිය ද, ඒ කෙරෙහි නිසි අවධානයක් යොමු නොවුන බව දැන්වීය. එබැවින්, ඒ කෙරෙහි නැවත් සභාවේ අවධානය යොමු කරවන බව පැවසීය.

මෙම වර්ෂය සඳහා ගම නැගුම වැඩ සටහන යටතේ මෙම සභාව වෙත අනුමත වි ඇති මුල්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගෙන අදාල සංවර්ධන යෝජනාවන් ක්‍රියාත්මක කරවීමට කටයුතු කරමු යැයි පවසමින් සිය කථාව අවසන් කරනලදී.

13:05 **ගරු නාගරික මන්ත්‍රී,ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමාඃ**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, මෙම සභාවේ විපක්ෂ නායක මැතිතුමාගේ දයාබර මෑණියන් පසුගිය දා අභාවප්‍රාප්ත වු බවත්, එම උත්සව අවස්ථාවට මෙම සභාව වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් නිසි දායකත්වයක් නොලැබුණු බව තමාට හැඟෙන බවත්, යටත් පිරිසෙයින් මෙම සභාවේ ශෝකය පළකිරිමේ බැනර් එකවත් ප්‍රදර්ශනය කිරීමට කටයුතු කර නොතිබුණු ඒ සම්බන්ධව තමාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත් පැවසිය. එතුමා විපක්ෂ මන්ත්‍රීවරයෙකු වුවද, එතුමාට ද සභාවේ ගෞරවයක් , වගකීමක් තිබෙන අතර, කුමන පක්ෂයක වුවද අප සියළු දෙනා බලන්ගොඩ ප්‍රදේශයේ ජීවත්වන , නිරන්තව හමුවන පිරිසක් බැවින්, දුක සැප බෙදාගෙන කටයුතු කිරීම අපගේ යුතුකම බව දැන්වූ අතර මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදුනොවීමට කටයුතු කරමු යැයි ද පැවසීය.

වැවේගෙදර මාර්ගය සකස් කරදෙන ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා , බළන්ගොඩ රෝහලේ රුධිරය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය අක්‍රීය වී ඇති බව තමාට ද දැනගැනීමට ලැබී ඇති බවත්, එබැවින්, අහිංසක රෝගී ජනතාව කෙරෙහි අවධානය යොමු කර එය සකස් කරවීමට අදාළ බලධාරීන්ගේ අවධානය යොමුකරවන ලෙස ඉල්ලා සිටින ලදී.

රාස්සගල මාර්ගයේ සංවර්ධන කටයුතු වලට කම්කරුවන් 05-06 ක් එවීමට කටයුතු කරන බවත්, ඔවුන්ට අදාල දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14. **අවසානය:**

ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

අද දින සභා රැස්වීමට සහභාගී වූ ගරු උපසභාපතිතුමා,ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම් මහතා වෙත සිය ස්තුතිය පුදකරමින් රැස්වීමේ කටයුතු ප.ව.02.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.